# සිරිධම්ම විද්‍යාලය
## SIRIDHAMMA COLLEGE

## 11 ශ්‍රේණිය - පළමු වාරය, 2020

## ඉතිහාසය 1

*සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.*

1) ශ්‍රී ලංකාව පිලිබඳ තොරතුරු ඇතුලත් "ඉන්ඩිකා" නම් කෘතිය රචනා කළේ කවුරුන් විසින්ද?
    1. ටොලමි
    2. ප්ලිනි
    3. ඇරිස්ටෝටල්
    4. මෙගස්තීනිස්

2) ගලේ කොටා ඇති ඉර, හඳ, වටාපොත, හක්ගෙඩිය පැරණි සලකුණුවලින් පෙන්වා ඇත්තේ?
    1. පුරාවිද්‍යාත්මක ස්ථානයන් ය
    2. ප්‍රාදේශීය මායිම් ය
    3. නිදන් වස්තූන් ය
    4. පූදනයන් ය

3) ශ්‍රී ලංකාවේ පූර්ව ඓතිහාසික යුගයට අයත් මහා ශිලා සුසාන පිහිටි ස්ථාන නිවැරදිව දක්වා ඇත්තේ,
    1. ඉබ්බන්කටුව හා යටිගල්පොත්ත
    2. රංචාමඩම හා බෙරගල
    3. යටිගල්පොත්ත හා උඩරංචාමඩම
    4. උඩරංචාමඩම හා ඉබ්බන්කටුව

4) 'කැති අඩ' නමින් හැඳින් වූ බද්ද අය කරන ලද්දේ,
    1. ඇළ මාර්ග වලිනි
    2. හේන් වලිනි
    3. වැව් වලිනි
    4. කුඹුරු වගාවෙනි

5) පරිපාලන දිස්ත්‍රික්ක වැඩිකර ඒ ඒ දිස්ත්‍රික්ක පාලනය සඳහා ඇමැතිවරු පත් කිරීම සිදු වූයේ මින් කවර රාජ්‍ය සමයකද?
    1. පණ්ඩුකාභය
    2. දේවානම්පියතිස්ස
    3. වසභ
    4. දුටුගැමුණු

6) ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා දන්ත ධාතුව ශ්‍රී ලංකාවට වැඩම කළ තොටුපොල පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
    1. මහාතිත්ථ හා ලංකාපටුන
    2. ලංකාපටුන හා කාලතිත්ථ
    3. දඹකොළපටුන හා ලංකාපටුන
    4. දඹකොළපටුන හා මහාතිත්ථ

7) පොහොය දිනවල වෙළෙඳම් කළ අයට දඩ නියම කළ බවට තොරතුරු ලැබෙන මූලාශ්‍රය කුමක්ද?
    1. මිහින්තලා පුවරු ලිපිය
    2. ගල්පොත සෙල්ලිපිය
    3. සොරබොර වැව ටැම්ලිපිය
    4. වේවැල්කැටිය ශිලාලිපිය

8) අතීතයේදී 'ගව්ව' යන මිනුම භාවිතා කරන ලද්දේ,
   1. බර මැනීමට ය
   2. දුර මැනීමට ය
   3. කාලය මැනීමට ය
   4. උස මැනීමට ය

9) කලාත්මක බව, ජල කළමනාකරණය හා තාක්ෂණය සංකලනය වූ විශිෂ්ට නිර්මාණයක් ලෙස අගය කළ හැක්කේ,
   1. ගල් පාලමය
   2. බිසෝ කොටුව
   3. කුට්ටම් පොකුණ
   4. සොරොව්ව

10) අතීතයේදී විවිධ ජාතීන් අතුරින් වැඩි පිරිසක් මෙරටට පැමිණියේ,
   1. සංචාරක කටයුතු සඳහා ය
   2. දේශ ගවේෂණය සඳහා ය
   3. වෙළෙඳාම පිණිස ය
   4. බලය අල්ලා ගැනීම සඳහා ය

11) අතීතයේ යම් අපරාධකරුවකු ගමේ සැඟවී සිටින අවස්ථාවක ඔහු අල්ලා දීමේ වගකීම පැවරී තිබුනේ,
   1. ගම්කට ය
   2. පරුමකට ය
   3. දසගම් ඇත්තන්ට ය
   4. ගමේ සියලු දෙනාට ය

12) "වෙන් හෝ" නම් සෙන්පතියා යටතේ මෙරටට එල්ල වූ චීන හමුදා ආක්‍රමණයක් ගැන සඳහන් වන්නේ කුමන පාලන යුගයකදී ද?
   1. දඹදෙණිය
   2. යාපහුව
   3. ගම්පොළ
   4. කෝට්ටේ

13) අරාබි ජාතිකයින් ශ්‍රී ලංකාව හැඳින්වීමට භාවිතා කළ නාමය,
   1. සෙයිලාන් ය
   2. තම්පබපණ්ණි ය
   3. සෙරන්ඩිබ් ය
   4. තැප්‍රෝබේන් ය

14) උඩරට රාජධානියේ බලයට පත් පළමු නායක්කර් රජු වන්නේ,
   1. රාජාධිරාජසිංහ
   2. කීර්ති ශ්‍රී රාජසිංහ
   3. ශ්‍රී වික්‍රම රාජසිංහ
   4. ශ්‍රී විජය රාජසිංහ

15) ශ්‍රී ලංකාව බහු වාර්ගික, බහු ආගමික මෙන්ම විවිධ සංස්කෘතීන්ට අයත් රටක් වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,
   1. යහපත් දේශගුණයක් පැවතීම
   2. ස්වභාවික සම්පත් බහුල රටක් වීම
   3. ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටීම
   4. දූපතක් වශයෙන් පිහිටීම

16) උඩරට පාලන සංවිධානය තුළ "බද්දේ" සංවිධානය යටතේ "මඩිගෙ බද්ද" කාර්යාංශයට පැවරී තිබුණේ,

1. කුරුඳු තැලීම
2. ප්‍රවාහනය
3. රෙදි විවීම
4. ඇතුන් ඇල්ලීම

17) පුනරුද සමයේ සාහිත්‍ය අංශයට ඉමහත් මෙහෙවරක් කළ කතුවරයෙකු නොවන්නේ,

1. ඩාන්ටේ
2. ශේක්ස්පියර්
3. බොකෑෂියෝ
4. මාටින් ලූතර් කිං

18) කාර්මික විප්ලවය ආරම්භ වූ මුල්ම රට වන්නේ,

1. ඇමරිකාව
2. ප්‍රංශය
3. බ්‍රිතාන්‍යය
4. ප්‍රශියාව

19) කාර්මික විප්ලව සමයේ "මැකඩම් ක්‍රමය" හඳුන්වා දුන්නේ,

1. පේෂ කර්මාන්තයට ය
2. මහා මාර්ග ඉදි කිරීමට ය
3. යකඩ හා වානේ නිපදවීමට ය
4. දුම්රිය මාර්ග තැනීමට ය

20) කාර්මික විප්ලවය නිසා වර්ධනය වූ සමාජ ප්‍රතිඵලයකි.

1. නාගරීකරණයේ වර්ධනය වේගවත් වීම
2. මූල්‍ය හා බැංකු සේවා පුළුල් වීමට පටන් ගැනීම
3. භාණ්ඩ හා සේවා ලාභයටත් ඉක්මනටත් සැපයිය හැකි වීම
4. බහුජාතික සමාගම් වර්ධනය වීම